18.වාක්‍ය රීති

- උක්තය, කර්මය, ක්‍රියාව වශයෙන් වාක්‍යයක ප්‍රධානඅංග තුනකි.
- කර්තෘ කාරක වාක්‍යයක ක්‍රියාව කරන්නා කර්තෘ වන අතර එය උක්ත වේ.
- උක්ත පදයේ ලිංග භේදය හා වචන භේදය අනුව ක්‍රියා පදය ද වෙනස් වේ.

  උදාහරණ –: · අක්කා ගෙදර ගියාය.

  · අක්කලා ගෙදර ගියෝය.

  · අය්යා ගෙදර ගියේය.

  · අය්යලා ගෙදර ගියෝය.
- මීට පෙර පාඩම්වලදී අප වචන භේදය, ලිංග භේදය, කාල භේදය පිළිබඳ ඉගෙනගෙන ඇත්තෙමු.
- ලිංග භේදය අනුව උක්ත අනුක්ත නාම පද යෙදෙන ආකාරය විමසා බලමු.

පුරුෂ ලිංග		ස්ත්‍රී ලිංග		නපුංසක ලිංග	
උක්ත	අනුක්ත	උක්ත	අනුක්ත	උක්ත	අනුක්ත
මිනිසා	මිනිසා	ගැහැනිය	ගැහැනිය	ගස	ගස
මිනිසෙක්	මිනිසෙකු	ගැහැනියක්	ගැහැනියක	ගසක්	ගසක
මිනිස්සු	මිනිසුන්	ගැහැනු	ගැහැනුන්	ගස්	ගස්
දරුවා	දරුවා	දැරිය	දැරිය	පැන	පැන
දරුවෙක්	දරුවෙකු	දැරියක්	දැරියක	පැනක්	පැනක
දරුවෝ	දරුවන්	දැරියෝ	දැරියන්	පැන්	පැන්
කුරුල්ලා	කුරුල්ලා	කිරිල්ලිය	කිරිල්ලි	පොත	පොත
කුරුල්ලෙක්	කුරුල්ලෙකු	කිරිල්ලක්	කිරිල්ලක	පොතක්	පොතක
කුරුල්ලෝ	කුරුල්ලන්	කිරිල්ලෝ	කිරිල්ලන්	පොත්	පොත්

- ඉහත ආකාරයට ඒක වචන බහු වචන භේදයට අනුව වචන ගොඩනැගෙන ආකාරය හොඳින් නිරීක්ෂණය කරන්න.

පැවරුම්

1. ඔබ අවට ඇති සියලුම නාම පද මේ ආකාරයට වගු ගත කරන්න.
2. පෙළ පොතේ අභ්‍යාසකරන්න.